# ඇබෑර්තු

## ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

## පරිපාලන නිලධාරී තනතුර

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ, පරිපාලන නිලධාරී පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**පරිපාලන නිලධාරී - JM-1-1- "කනිෂ්ඨ කළමනාකාර" සේවා කාණ්ඩය - තනතුරු 01**

**අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් රාජ්‍ය කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය යන ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් මූලික උපාධියක් ලබා තිබීම.

(ආ) මූලික උපාධිය ලබාගැනීමෙන් අනතුරුව කළමනාකරණ මට්ටමේ වසර 10 පළපුරුද්ද හෝ පසුගිය වසර 10 ක කාලය තුළ පරිපාලන හෝ මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ වෘත්තීය පරිපාලන ආයතනයක සාමාජිකත්වය ලබා තිබීම.

(ඇ) පරිගණක සාක්ෂරතාවය සහ ERP පද්ධතිය, කම්කරු නීති සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පිළිබඳ පූර්ණ දැනීමක්.

(ඈ) විශිෂ්ට සන්නිවේදන සහ අන්තර් පුද්ගල කුසලතා සමග ඉංග්‍රීසි සහ සිංහල/ දෙමළ භාෂා පිළිබඳ හොඳ දැනීමක්.

දැනටමත් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙහි සේවයේ නියුතු අයදුම්කරුවන් ඉහත මූලික සුදුසුකම් හා පළපුරුද්ද සපුරා ඇත්නම් අයදුම් කිරීමට සුදුසු වේ.

**වැටුප :** JM1-1 රු. 42,600-10X755 - 18X1,135=70,580

- සියලුම රාජ්‍ය අනුමත දීමනා සහ ජීවන අංක දීමනාව ගෙවනු ලැබේ.

**වයස :** රාජ්‍ය චක්‍රලේඛනවල නියම කර ඇති වයස් සීමාවන් අදාළ වේ.

**සෑම අයදුම්කරුවෙක්ම**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
- තනතුරට අදාළ රාජකාරී ඉටුකිරීම සඳහා යෝග්‍ය කායික හා මානසික තත්ත්වයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතුය.

**අදාළ තනතුර සඳහා පොදු කොන්දේසි**

- මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර, විශ්‍රාම වැටුප් හිමි නොවේ. සේවකයා සේවක අර්ථසාධක අරමුදලට 10% ක් දායක විය යුතු අතර, සේවා යෝජකයා සේවක අර්ථසාධක අරමුදලට 15% ක් සහ සේවක භාරකාර අරමුදලට 3% ක් දායක වේ.
- රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලගී සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානින් හරහා අයදුම්පත් යොමු කළ යුතුය.
- අයදුම්කරු පිළිබඳ වාර්තාවක් ලබාගත හැකි ඥාතීන් නොවන නිර්දේශකවරුන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.
- අධ්‍යාපන සහතික සහ වෙනත් සුදුසුකම් සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතිකයන්හි ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට අයදුම්කරු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**රැකියා විස්තරය :**

ලේඛකාධිකාරිවරයාගේ මගපෙන්වීම යටතේ SLMC හි සියලුම පරිපාලන කාර්යයන්හි වගකීම සහ පරිපාලන සහ කළමනාකරණ සහාය සැපයීම.

**අයදුම්කරන පිළිවෙල :**

සුදුසුකම්ලත් අයදුම්කරුවන් තමන්ගේ අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් පෞද්ගලික තොරතුරු ඇතුළත් ජීව දත්ත පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහා එවන කවරයෙහි ඉහළ වම් කෙළවර ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ admin@slmc.gov.lk විද්‍යුත් ලිපිනයට එවීමෙන් 2024.11.18 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අපැහැදිලි සහ අසම්පූර්ණ අයදුම්පත් සහ මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් වෙතින් ලැබෙන අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව,**
**අංක 31, නොරිස් කැනල් පාර,**
**කොළඹ 10.**
**2024.11.03**